## වෂර් 2021 ක්වු ඔක්තෝබර් මස 21 වන දින උඩපළාත ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ වාතර්ාව

වේලාව - පෙරවරු 10.00

- ❖ පැමිණීම

| | |
|---|---|
| 01.D.Gගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීතර්ි රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධමර්සිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05..S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06 D.G ජයන්ත කීතර්ිසිංහ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07.M.G.W.C.B වේරපිටිය මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08.U.G පාලිත මහින්ද ජිනදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09.M.G මොහොමඩ් මුරාඩ් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10.M.G උපචන්ද්‍ර ජයපති මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11.M.G.R පාලිත අබේරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12. 12.A.C මොහොමඩ් ෆසාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13.D.W.G හේමකුමාර නයනානන්ද මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14.W.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15.R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16.A.H.A රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17.G.A අරුණ ප්‍රසන්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18. 18.H.M නීල් සුගත් කුමාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19.A. සමන්ත කුමාර ආරියදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20.W.D.G ගුණතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 21.H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 22.R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |

23.A ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා



24.මුතු නීලමේගම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

25.තංගවේලු කාමරාජන් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

26..H.G සුසිලාවති මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

27. 28.W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

28.K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

29.P.T.G වයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

30.R චමිලා ෆොන්සේකා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

31.H.G සුභද්‍රා සමරනායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

32.K සුප්පයියා ජීවා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

33.පිච්චෙයි සෙල්වපූනේස්වරී මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

34..කුමාරවේලු කනගරත්නම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

35.N.R.M.D නවරත්න රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

36.ගයානි ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

<u>සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්</u>

37. D.M දීසායු මංජුල දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

38..R.M උදයකුමාර දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

39.R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

40.D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

41.වත්සලා චතුරාණි සේනානායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

42.සෙල්වරාජ් කාතරීකා මෙනෙවිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

43.චාමික රුවන් දසනායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

<u>.ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

<u>1.පසුගිය මහසභාවේ සභා වාර්තාව සහා සම්මත කිරිම</u>

පසුගිය සැප්තැම්බර් මස 23 වන දින මහ සභා වාර්තාව සහා සම්මත කර ගැනීම.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

පසුගිය සැප්තැම්බර් මස 23 වන දින මහ සභා වාර්තාව සභා සම්මත කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**

පසුගිය සැප්තැම්බර් මස 23 වන දින මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමිය**

එම යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු අගලවත්ත මන්ත්‍රීතුමා**

ගියවර සභාවේදී WPPF-7352 කැබ් රථය අළුත්වැඩියාව සදහා ඡන්ද විමසීමක් කල බවත් එහිදි යෝජනාවට පක්ෂව ඡන්ද 23ක්ද විපක්ෂව ඡන්ද 10ක් ද නොපැමිණි සංඛ්‍යාව 10 ලෙසද සදහන් වූ නමුත් වාර්තාවේ වැඩි ඡන්ද 23කින් යෝජනාව සභා සම්මත වූ බව සදහන් කර ඇතත් එහි වැඩි ඡන්ද සංඛ්‍යාව 13 ලෙස නිවැරදි විය යුතු බවත් එදින අත්සන් ලේඛනයේ නොපැමිණි මන්ත්‍රී සංඛ්‍යාව 8 දෙනෙකු ලෙස සටහන් වී ඇති නිසා එය නිවැරදි කර ඡන්දය සදහා නොපැමිණි සංඛ්‍යාව 10 ලෙස සංශෝධනය විය යුතු බව සදහන් කරන ලදි.

**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**

ගියවර මහ සභාවට තමා සහභාගි නොවූ නිසා එම යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදි.

**ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා**

සංශෝධන සහිතව මහ සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ජයන්ත කීතරිසිංහ මන්ත්‍රීතුමා**

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව* සභා වාර්තාව *ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි*

2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

**ගරුසභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

1. වෙනසකට මහක් පැෆ්රල් පාඨමාලාව යටතේ කාන්තාවන් 100ක් දේශපාලන ප්‍රවාහයේ ප්‍රගමනයට සක්‍රීයව දායක කිරීම යටතේ අප සභාවේ ගරු මන්ත්‍රීවරියන්ට ඒ සදහා එක් විය හැකි බැවින් ඒ සම්බන්ධව ඒවා ඇති නිවේදනය සභාගත කරන ලදි.

2. තමා උඩපළාතේ සභාපති ලෙස වසර 3 ½ ක පමණ කාලයක් විවිධ හැල හැප්පීම් සහිතව සභාව කරගෙන ආ බවත් තමා මීට පෙර සෑම දිනකම ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ගෞරවණීය

ඉල්ලීම් පමණක් සිදුකල බවත් නමුත් කණගාටුවෙන් හෝ අද දින මෙම කාරණාව පැවසිය යුතු බවත් තමා කෙතරම් සත්භාවයෙන් කටයුතු කලත් සැම දිනකම කුමන හෝ කාරණාවක් මුල් කරගෙන ගැටළු ඇති කරන බවත් නමුත් සියළු දෙනාටම සම සේ ප්‍රතිපාදන මුදල් ලබාදුන් බවත් එලෙස කටයුතු කලේ සියළු දෙනාම එකට එක්ව සමඟියෙන් කටයුතු කල යුතු නිසා බවත් නමුත් ප්‍රශ්න ඇති කරනවා නම් ඉදිරියේදි තමා ඒ ගැන සලකා බලන බවත් සමහර ගරු මන්ත්‍රීවරු පාරවල් දිගේ පවා තමාට දොස් පවරමින් කටයුතු කරන බවත් එහිදි තමා නොව එම අයම අපහසුතාවයට පත්වන බවත් තමා අපහසුතාවයට පත් නොකරන ලෙසත් ඉදිරියේදී මේ සම්බන්ධයෙන් දැඩි තීන්දු තිරණ ගන්නා බවත් සභාපති ලෙස උත්තරීතර තනතුර හැල්ලුවට ලක් කල නොහැකි බවත් මහ සභාව උත්තරීතර සභාවක් බවත් එනිසා තමා සභාවේ උත්තරීතරභාවය ආරක්ෂා කරන බවත් කවුරු කෙසේ කීවත් තමා කිසිදු වරදක් නොකල බවත් තව දුරටද එසේ නොකරන බවත් තමාට විරුද්ධව කෙතරම් පොලීසියේ පැමිණිලි කලත්,උද්ඝෝෂණ කලත් , කැළෑ පත්තර යොමු කලත් තමා කිසිදු ප්‍රශ්නයක් ඇති නොකල බවත් තව කෙටි කාලයක් සභාව පවතින බවත් එම ටික කාලය සියළු දෙනා එකා වන්ව සහයෝගයෙන් කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තුවෙන් මෙම තොරතුරු තමා වේදනාවෙන් පවසන බවත් කිසි දිනක සභා දේපොළ තමා විකුණන් නැති බවත් සොරකම් නොකරන බවත් තමා සභාපති ලෙස කටයුතු කරන තාක් කිසිවෙකුට එසේ කිරිමට ඉඩ නොතබන බවත් පවසමින් මෙම කාරණා තරයේ ගරු මන්ත්‍රී මණ්ඩලයේ අවධානයට යොමු කරන බව සදහන් කරන ලදි.

<u>3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>
**සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි** නොමැති බව සදහන් කරන ලදි.

<u>4.කල් දී ඇති ප්‍රශ්න</u> - නොමැති බව සදහන් කරන ලදි.

<u>5.කල් දී ඇති යෝජනා</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05.1 (1)</u>

5 (1.1)2022 වෂර්ය සදහා ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සහ නිළධාරි මණ්ඩලය සදහා ඇමතුම් දිනපොත් හා දින දශර්න ඇණවුම් කර ලබා ගැනීම සම්බන්ධයෙන් මහ සභා තීරණයක් ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

2022 වෂර්ය සදහා ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සහ නිළධාරි මණ්ඩලය සදහා ඇමතුම් දිනපොත් හා දින දශර්න ඇණවුම් කර ලබා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (2)

5(1.2) දොළුව මහජන පුස්තකාලය ඩිජිටල් පුස්තකාලයක් ලෙස සංවධර්නය කිරීමේදී දත්ත ඇතුළත් කිරීම සහ අයදුම්පත් පරිසණක ගත කිරීම 2021.12.25 දිනට පෙර ඉටු කර අවසන් කල යුතු බැවින් එම දිනය දක්වා පුස්තකාල සේවයේ නියුතු පුස්තකාලයාධිපති අනුෂා හේරත් මහත්මියට සහ පුස්තකාල සහායක ධම්මිකා අත්තනායක මියට නියමිත පැය 20 ට අමතරව පැය 60 බැගින් අතිකාල දීමනා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.පුස්තකාලයේ සිදුවන සංවධර්න කටයුතු සියළුම ගරු මන්ත්‍රී මණ්ඩලය තම තමන්ට හැකි වේලාවන් වල නිරීක්ෂණය කරන ලෙසට ඉල්ලීමක් කරන ලදි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

තමා පුස්තකාලයේ කටයුතු නිරීක්ෂණය කල බවත් එහිදි සිදුවන සංවධර්න කටයුතු තමා දුටු බවත් දොළුව ප්‍රදේශයේ දූ දරුවන්ට දොළුව පුස්තකාලය මඟින් විශාල සේවාවක් ඉටු වී ඇති බවත් පරිසණක පුහුණුව වාගේම ලබාදෙන සේවය තුළින් විශාල වෙනසක් සිදුවන බවත් මෙම ව්‍යාපෘතිය තුළ අඩුපාඩුවක් ලෙස පවතින පුස්තකාලයේ උඩු මහළට වෂර්ාවෙන් වන හානිය ගැන සොයා බලා කටයුතු කල යුතු බවත් එසේ නොමැති වුවොත් වියදම් කරන මුදල් අපතේ යා හැකි බවත් ඒ නිසා පොඩි මුදලක් වැය කර අපේ කම්කරුවන් යොදවා තෙමෙන ස්ථාන සකස් කල යුතු බවත් එසේම දොළුව නගරය ආශ්‍රිතව පවත්නා පුස්තකාලය නිසා එහි භූමිය අලංකාර ලෙස සකස් කල යුතු බවත් වැසිකිළි පද්ධතිය නවීකරණය කල යුතු බවත් අවට ඇති කැළි කසළ ඉවත් කර කැලෑ වී ඇති ප්‍රදේශ මසකට වරක්වත් ශුද්ධ කල යුතු බවත් පුස්තකාලයට පිවිසෙන ස්ථානයේ සිට සියළු ස්ථාන අලංකාර ලෙස සකස් කල යුතු බවත් සඳහන් කරමින් දොළුව පුස්තකාලයේ පුස්ථකාලයාධිපතිතුමිය ඇතුළු කණ්ඩායම විශාල කැපකිරීමක් කරන බව තමා දුටු බවත් ඒ නිසා උඩපළාත ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී මණ්ඩලයේ ස්තූතිය එම දෙපළට පුදකරන බවත් සඳහන් කරමින් පුස්තකාලයාධිපති අනුෂා හේරත් මහත්මියට සහ පුස්තකාල සහායක ධම්මිකා අත්තනායක මියට නියමිත පැය 20 ට අමතරව පැය 60 බැගින් අතිකාල දීමනා ලබා දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තමා සමඟ ලේකම්තුමිය දොළුව පුස්තකාලයේ නිරීක්ෂණය සඳහා ගිය බවත් සියළු ස්ථාන පරීක්ෂා කර බලා කටයුතු කරන ලෙස උපදෙස් දුන් බවත් එම කටයුතු ඉටු කරන බවත් සඳහන් කරන ලදි.

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (3)

5 (1.3) PB-7657 අංක දරන කෲ කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා එක්සත් ඩීසල් මෝටසර් ආයතනය මඟින් පරික්ෂා කිරිමෙන් අනතුරුව රු.153623.00ක මුදලක ඇස්තමේන්තුවක් ලබා දී ඇති අතර මේ සඳහා මධ්‍යම පළාත් සභාවේ යාන්ත්‍රික ඉංජිනේරුතුමිය වෙත යොමුකර නිදේශ ලබාගෙන ඇත.ඒ අනුව මෙම වාහනය අළුත්වැඩියා කිරීම සඳහා පළාත් පාලන

කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා මහ සභා අනුමැතිය අවශ්‍ය ව ඇති අතර ඒ සඳහා මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

PB-7657 අංක දරන කෘෂ කැබ් රථය අළුත්වැඩියාව සඳහා එක්සත් ඩීසල් මෝටසර් ආයතනය රු.153623.00ක මුදලක ඇස්තමේන්තුවක් ලබා දී ඇති බවත් යාන්ත්‍රික ඉංජිනේරුතුමිය අනුමත කර ඇති බවත් ඒ අනුව කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු  අගලවත්ත මන්ත්‍රීතුමා</u>

PB-7657 අංක දරන කෘෂ කැබ් රථය සම්බන්ධයෙන් සම්මත වූ යෝජනාව කාරක සභාවක් බවට පත් කර තිබුණු අඩුපාඩු අපි පෙන්වා දුන් බවත් එහිදි වාහනභාර නිළධාරිතුමා ගෙන්වා ප්‍රශ්න කර මෙහි යම්කිසි වරදක් රියදුරු මහතා විසින් සිදු කර ඇති බවට සභාව ප්‍රකාශ කල බවත් එසේම රියදුරු විසින් නියමිත කාල සීමාවේදි මෙම වාහනය සේවා කර නොමැති බවත් ඒ නිසා වාහනයේ බ්‍රේක් පද්ධතිය විනාශ වී ඇති බවත් මෙයට මාස 2කට ඉහතදි මෙම වාහනය රු.44600.00ක මුදලක් ගෙවා සකසා ඇති බවත් නමුත් එම කට්ටලයම නැවත ක්‍රියාත්මක කර ඇති බවත් ප්‍රාදේශීය ඉංජිනේරුතුමිය කුමක් කරනවාද නොදන්නා බවත් එය අපට අදාළ නොවන බවත් මේ සම්බන්ධයෙන් අපි ඔබතුමාට විරුද්ධව කථා නොකරන බවත්  අපි අපේ ප්‍රායෝගික දැනුමෙන් කථා කරන බවත්  මෙහි කවුරුන් හෝ මුදල් සොරකම් කරන බවත්  මුදල් ගසා කන බවත් ඒ නිසා මේ දේවල් වලට අපව දායක කර ොනාගන්නා ලෙස පවසන බවත් එනිසා අපි අදහස් දක්වන බවත් මහජන මුදල් ගසාකෑමට අපි විරුද්ධ බවත් කැබ් රථයේ බ්‍රේක් සකස් කර මාස 2කින් පසු නැවත රු.31000.00 බ්‍රේක් පද්ධතිය සකස් කිරීමට යොදවා ඇති බවත් එවිට කලින් වියදම් කල රු.44600.00 මුදල කුමක් සඳහා වැය කළාද සිතන බවත් නිළධාරින් විසින් වාහනය සවරීස් කරන ලෙස පවසා තිබියදී සවරීස් නොකල නිසා එන්ජිම විනාශ වූ බවත් ඒ නිසා අපි මේ සඳහා විරුද්ධ වූ බවත් රියදුරන් කරන වංචාවන් සඳහා ඔබතුමා වග කිව යුතු නොවන බවත් මෙහි සම්පූර්ණ වංචාවක් සිදු වී තිබෙන නිසා අදත් මෙම වාහනයේ අළුත්වැඩියාව සඳහා මුදල් ගෙවනවාට අපි විරුද්ධ වන බවත් මේ සඳහා අනිවාර්යෙන්ම විධිමත් පරීක්ෂණයක් සිදුකරන ලෙසට සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ඔබතුමන්ලා කිසිම වාහනයක් ධාවනය කරන්න අළුත්වැඩියා කිරීමට ඉඩ නොදෙන බවත් මේ නිසා තමා අපහසුතාවයට පත් වන බවත් සඳහන් කරන ලදි.

<u>ගරු  අගලවත්ත මන්ත්‍රීතුමා</u>

මේ සඳහා විධිමත් පරීක්ෂණයක් සිදුකර වැරදි කරුවන්ට දඩුවම් ලබා දෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටින බවත් නැතිනම් අපි මහජන මුදල් ගසා කන හොරු බවට පත් වන බවත් ඒ නිසා මන්ත්‍රීවරු ලෙස කවුරුන් හෝ කරන හොර වැඩ වලට අපි හොරු වන්නට සූදානම් නැති බවත් කවුරුන් හෝ සොරකම් කරනවා නම් අපි ඒ සඳහා උදව් නොකරන බවත් අපට අවංකව නිවසට වී සිටීමට අවස්ථාව තිබිය යුතු බවත්  ඒ නිසා තමාගේ විරෝධතාවය සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

එසේ නම් වාහන අළුත්වැඩියාවට අකමැති නම් ධාවනය සඳහා වාහන අවශ්‍ය නිසා මේ සම්බන්ධයෙන් බෙදීමකට යාමට අවස්ථාව ඉල්ලා සිටින ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05.1 (4)</u>

5(1.4) 43-3382 අංක දරණ ලොරි රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.25100.00 මුදලක් එක්සත් ඩීසල් මෝටසර් ආයතනය වෙත ගෙවීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

43-3382 අංක දරණ ලොරි රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.25100.00 මුදලක් එක්සත් ඩීසල් මෝටසර් ආයතනයට ෙගවීමට ඇති බවත් මෙය සභාවේ කුණු අදින ලොරි රථය බවත් අත්‍යාවශ්‍ය වාහනයක් බවත් ඒ නිසා මෙම වාහනය අළුත්වැඩියාව සඳහා අවශ්‍ය කරන මුදල් නිසි වේලාවට අදාළ ආයතන වලට ගෙවා නැවත ධාවනයේ යෙදවීම කල යුතු වන නිසා මෙම මුදල ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු  අගලවත්ත මන්ත්‍රීතුමා</u>

43-3382 අංක දරණ ලොරි රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා ද විරුද්ධ බව ප්‍රකාශ කරන ලදි.

මෙම මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙසට මම යෝජනා කරමි.

<u>ගරු පාලිත මහින්ද ජිනදාස මන්ත්‍රීතුමා</u>

ඒම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු  අගලවත්ත මන්ත්‍රීතුමා</u>

මෙම කාරක සභාව නැවත මහ සභාවක් බවට පත් කරන ලෙසට මම යෝජනා කරමි.

<u>ගරු පාලිත මහින්ද ජිනදාස මන්ත්‍රීතුමා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු  අගලවත්ත මන්ත්‍රීතුමා</u>

මෙහි බ්‍රේක් පද්ධතිය දමන විට අංග සම්පූර්ණ අළුත්වැඩියාවක් කල බවත් එහිදි බ්‍රේක් වොශර්, මාස්ටර් පොම්පයේ වොශර් ටික දමන්න සිලින්ඩර් වොශර් දමන්න රු.25400.00 යොදා ඇති බවත් බ්‍රේක් ලයිනර් ගැසීමක් සිදුවී නොමැති බවත් එසේ කර තිබුණා නම් සෑහීමකට පත්විය හැකි බවත් මේ සඳහා රු.9800.00ක මුදලක් පමණක් වැය වන බවත් මාස්ටර් පොම්පයේ රෙපෙයාර් එකට හා මාස්ටර් පොම්පයේ වොශර් කිට් එකට කියා  එකම දෙයට දෙවරක් මුදල් යොදවා ඇති බවත් ඒ නිසා මෙම මිළ ගණන් කිසිසේත් පිළිගත නොහැකි බවත් රු.25140.00

ලෙස එකතුව නිවැරදි වුවත් යම්කිසි අයෙකුට මුදල් වංචා කිරීමට මේ බිල ඉදිරිපත් කර ඇති බව සඳහන් කරමින් මුදල් කමිටුවේද ගෙවීම ප්‍රතික්ෂේප වූයේ මේ නිසා බව සඳහන් කරන ලදි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

මෙම වාහන දෙක ගාල් කර ඇති බවත් මෙම යෝජනා දෙකම පසුගිය සභාවටත් ඉදිරිපත් කර ඇති බවත් මුදල් කාරක සභාවේ තීරණය අනුව මහ සභාවට නැවත ඉදිරිපත් කල බවත් ඒ නිසා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ඇතිව අළුත්වැඩියා කටයුතු කල යුතුව ඇති නිසා මේ යෝජනා දෙක සඳහා ඡන්ද විමසීමක් සිදුකිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

ඒම යෝජනාව මම ස්ථිර කරමි.

## <u>5 (1.3)PB-7657 අංක දරන කෲ කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා ඡන්ද විමසීම</u>

| අනු අං. | නම | පක්ෂව | විපක්ෂව | ස්වාධීන | නොපැමිණිම |
|---|---|---|---|---|---|
| 01 | ගරු සභාපති ඩී.ජී. ගුණසේන මහතා | පක්ෂ | | | |
| 02 | ගරු උප සභාපති අසේල අමරසේන මහතා | පක්ෂ | | | |
| 03 | ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 04 | ගරු ධමර්සිරි අගලවත්ත මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 05 | ගරු S.A නවරත්න බණ්ඩා මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 06 | ගරු ජයන්ත කීතරීසිංහ මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 07 | ගරුC.B වේරපිටිය මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 08 | ගරු පාලිත මහින්ද ජිනදාස මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 09 | ගරු මොහොමඩ් මුරාඩ් මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 10 | ගරු උපචන්ද්‍ර ජයපති මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 11 | ගරු R පාලිත අබේරත්න මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 12 | ගරු දීසායු මංජුල දිසානායක මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 13 | ගරු උදයකුමාර දිසානායක මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 14 | ගරු කාදර් මොහොමඩ් ෆසාල් මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 15 | ගරු හේමකුමාර නයනානන්ද මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 16 | ගරු W ප්‍රේමතිලක මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 17 | ගරු රවින්ද්‍ර දිනුක රත්නායක මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 18 | ගරු A.H.A රත්නායක මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 19 | ගරු අරුණ ප්‍රසන්න මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 20 | ගරු ප්‍රේමරත්න බණ්ඩාර මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 21 | ගරු නීල් සුගත් කුමාර මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 22 | ගරු සමන්ත කුමාර ආරියදාස මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 23 | ගරු W.D.G ගුණතිලක මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 24 | ගරු යසස් බණ්ඩාර දෙනුවර මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 25 | ගරු රන්ජන් රාජපක්ෂ මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 26 | ගරු ධනුෂ්ක ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 27 | ගරු මුතු නීලමේගම්මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 28 | ගරු තංගවේලු කාමරාජන් මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 29 | ගරු ප්‍රසන්න මනෝජ් තිලකරත්න මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 30 | ගරු සුසිලාවති මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 31 | ගරු වත්සලා චතුරාණි සේනානායක මන්ත්‍රීතුමිය | | | | නොපැමිණි |
| 32 | ගරු ඕමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 33 | ගරු වයලා විනෝදනි  මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 34 | ගරු කෝකිලා කුමාරි මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 35 | ගරු සෙල්වරාජ් කාතරීකා මන්ත්‍රීතුමිය | | | | නොපැමිණි |
| 36 | ගරු චමිලා ෆොන්සේකා මන්ත්‍රීතුමිය | | | ස්වාධීන | |
| 37 | ගරු සුබද්‍රා සමරනායක මන්ත්‍රීතුමිය | | | ස්වාධීන | |
| 38 | ගරු සුප්පයියා ජීවා මන්ත්‍රීතුමා | | | ස්වාධීන | |
| 39 | ගරු සෙල්වපූනේස්වරී මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 40 | ගරු කුමාරවේලු කනගරත්නම් මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 41 | ගරු නවරත්න රත්නායක මන්ත්‍රීතුමා | | | ස්වාධීන | |
| 42 | ගරු ගයානි ශ්‍රියාමාලා මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 43 | ගරු චාමික රුවන් දසනායක  මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |

PB-7657 කැබ් රථයේ අළුත්වැඩියාවට පක්ෂව ඡන්ද - 20

PB-7657 කැබ් රථයේ අළුත්වැඩියාවට විපක්ෂව ඡන්ද - 09

ස්වාධීන -04

නොපැමිණි - 10

ඒ අනුව වැඩි ඡන්ද 11කින් PB-7657 කැබ් රථයේ අළුත්වැඩියාව සිදුකල යුතු බවට ගෙන ආ යෝජනාව සභා සම්මත විය.

<u>5 (1.4) 43-3382 අංක දරණ ලොරි රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියා කිරීම</u>

| අනු අං. | නම | පක්ෂව | විපක්ෂව | ස්වාධීන | නොපැමිණීම |
|---|---|---|---|---|---|
| 01 | ගරු සභාපති ඩී.ජී. ගුණසේන මහතා | පක්ෂ | | | |
| 02 | ගරු උප සභාපති අසේල අමරසේන මහතා | පක්ෂ | | | |
| 03 | ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 04 | ගරු ධමර්සිරි අගලවත්ත මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 05 | ගරු S.A නවරත්න බණ්ඩා මන්ත්‍රීතුමා | | | ස්වාධීන | |
| 06 | ගරු ජයන්ත කීතරීසිංහ මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 07 | ගරුC.B වේරපිටිය මන්ත්‍රීතුමා | | | ස්වාධීන | |
| 08 | ගරු පාලිත මහින්ද ජිනදාස මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 09 | ගරු මොහොමඩ් මුරාඩ් මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 10 | ගරු උපචන්ද්‍ර ජයපති මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 11 | ගරු R පාලිත අබේරත්න මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 12 | ගරු දීසායු මංජුල දිසානායක මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 13 | ගරු උදයකුමාර දිසානායක මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 14 | ගරු කාදර් මොහොමඩ් ෆසාල් මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 15 | ගරු හේමකුමාර නයනානන්ද මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 16 | ගරු W ප්‍රේමතිලක මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 17 | ගරු රවින්ද්‍ර දිනුක රත්නායක මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 18 | ගරු A.H.A රත්නායක මන්ත්‍රීතුමා | පක්ෂ | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 19 | ගරු අරුණ ප්‍රසන්න මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 20 | ගරු ප්‍රේමරත්න බණ්ඩාර මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 21 | ගරු නීල් සුගත් කුමාර මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 22 | ගරු සමන්ත කුමාර ආරියදාස මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 23 | ගරු W.D.G ගුණතිලක මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 24 | ගරු යසස් බණ්ඩාර දෙනුවර මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 25 | ගරු රන්ජන් රාජපක්ෂ මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 26 | ගරු ධනුෂ්ක ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා | | | ස්වාධීන | |
| 27 | ගරු මුතු නීලමේගම්මන්ත්‍රීතුමා | | | ස්වාධීන | |
| 28 | ගරු තංගවේලු කාමරාජන් මන්ත්‍රීතුමා | | | ස්වාධීන | |
| 29 | ගරු ප්‍රසන්න මනෝජ් තිලකරත්න මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 30 | ගරු සුසිලාවති මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 31 | ගරු වත්සලා චතුරාණි සේනානායක මන්ත්‍රීතුමිය | | | | නොපැමිණි |
| 32 | ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමිය | | | ස්වාධීන | |
| 33 | ගරු වයලා විනෝදනි  මන්ත්‍රීතුමිය | | | ස්වාධීන | |
| 34 | ගරු කෝකිලා කුමාරි මන්ත්‍රීතුමිය | | | ස්වාධීන | |
| 35 | ගරු සෙල්වරාජ් කාතරීකා මන්ත්‍රීතුමිය | | | | නොපැමිණි |
| 36 | ගරු චමිලා ෆොන්සේකා මන්ත්‍රීතුමිය | | | ස්වාධීන | |
| 37 | ගරු සුබද්‍රා සමරනායක මන්ත්‍රීතුමිය | | | ස්වාධීන | |
| 38 | ගරු සුප්පයියා ජීවා මන්ත්‍රීතුමා | | | ස්වාධීන | |
| 39 | ගරු සෙල්වපූනේස්වරී මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 40 | ගරු කුමාරවේලු කනගරත්නම් මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 41 | ගරු නවරත්න රත්නායක මන්ත්‍රීතුමා | | | ස්වාධීන | |
| 42 | ගරු ගයානී ශ්‍රියාමාලා මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 43 | ගරු චාමික රුවන් දසනායක  මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |

43-3382 අංක දරණ ලොරි රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියාවට පක්ෂව ඡන්ද - 12

43-3382 අංක දරණ ලොරි රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියාවට විපක්ෂව ඡන්ද - 09

ස්වාධීන - 12

නොපැමිණි - 10

ඒ අනුව වැඩි ඡන්ද 03කින් 43-3382 අංක දරණ ලොරි රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියාව සිදුකල යුතු බවට ගෙන ආ යෝජනාව සභා සම්මත විය.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

මෙම විමසුම අපි සිදු කලේ ඔබතුමාට විරුද්ධව නොවන බවත් අපි මේ දෙය නොකළා නම් මෙය වරදක් බවත් සභාවේ මුදල් රියදුරන් වංචනික ලෙස රැගෙන ඇති බවත් මින් ඉදිරියටවත් මේ සිදුවීම් නතර වේයැයි තමා විශ්වාස කරන බවත් සදහන් කරන ලදි.

*දිනුක රත්නායක මන්ත්‍රීතුමා*

අපි සභාපතිතුමාට හැමදාම ගරු කරන බවත් නමුත් මෙහිදී අපි කිසිම දෙයක් නොදන්නා අය නොවන නිසා තමා 5 (1.4) 43-3382 අංක දරණ ලොරි රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියා කිරීම යන යෝජනාවට පක්ෂව ඡන්දය දුන් *මන්ත්‍රීතුමන්ලාගෙන්* මාස්ටර් පොම්පයේ වොශර් දැමීමට රු.2500.00 රෙපෙයාර් කිට් එකට රු.5950.00 ලෙස සදහන් බවත් ඒ නිසා රෙපෙයාර් කිට් එකට අදාළ අංගෝපාංග ටික පවසන ලෙස සදහන් කරන ලදි. එවිට අපි මේ සදහා විරුද්ධ වූයේ ඇයිදැයි තේරුම් ගත හැකි වනු ඇතැයි සදහන් කරන ලදි.

*ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා*

රු.25100.00 යන මුදල වෙළඳපොළ වටිනාකම අනුව නොගැළපෙන බවට බහුතර පිරිසකගේ අදහස වී ඇති බවත් ඒ නිසා අපි මෙලෙසට අනුමත නොකර ගෙවීම් කළා නම් විරෝධතාවය දැක්වීම ගැටළුවක් නොවන බවත් සභාවේ මතය අනුව ඒ නිසා යාන්ත්‍රික ඉංජිනේරුතුමිය වෙත යොමු කර නිරවුල් කරගත යුතු බවත් මේ සදහා අපට තීන්දු කල නොහැකි බවත් බහුතරය විරුද්ධ වී ඇති බවත් සදහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*තීරණ අංක 05.1 (5)*

5 (1.5) පවතින කොරෝනා වසංගත තත්වය හේතුවෙන් සංචරණ සීමා පැනවීම නිසා 2021 සැප්තැම්බර් මස බිල් කරන ලද කඩ කාමර කුලීය වන රු.345567.48 ක මුදල පොතෙන් කපා හැරීම සදහා මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

මේ සදහා මහ සභා අනුමැතිය ලබාගෙන කොමසාරිස්තුමා සහ ගරු ආණ්ඩුකාරතුමාගේ අවධානය සදහා යොමු කරන බව සදහන් කරන ලදි.

*ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා*

එම යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු A.H.A රත්නායක මන්ත්‍රීතුමා**

කහවත්තේ අපේ ගමේ පොහොර කඩයක් සහ කබඩ් විකුණන කඩයක් තිබෙන බවත් එම කඩ දෙක කොරෝනා සමයේ විවෘත කර තිබුන බවත් ඒ නිසා කොරෝනා තත්වය කියා රු.345567.48 ක මහජන මුදලක් පොතෙන් කපා හැරීමට තමා පුද්ගලිකව විරුද්ධ වන බවත් සඳහන් කරන ලදි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

කොරෝනා වසංගතය නිසා මිනිසුන් අසරණ වූ බවත් ඒ නිසා මෙම මුදල කපා හැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

යම් යම් අඩුපාඩු ප්‍රශ්න තිබුනත් අපට එක් එක් ප්‍රදේශ වෙන් කර කටයුතු කල නොහැකි බව සඳහන් කරන ලදි.

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

තීරණ අංක 05.1 (6)

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

5 (1.6) කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිළධාරින් සේවයේ යොදවා ගැනීම යටතේ දැනට උඩපළාත ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු තාක්ෂණ නිළධාරි පී.ජී.එස්. ජයතිලක මහතා 2021.01.29 දින සිට වසරක කාලයක් උඩපළාත ප්‍රාදේශීය සභාවේ තවදුරටත් සේවය සදහා යොදවා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

තවද අපි ඉන්ද්‍රාණී තාක්ෂණ නිළධාරිතුමියවද ඉල්ලා ඇති බව සඳහන් කරන ලදි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

දැනට උඩපළාත ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු තාක්ෂණ නිළධාරි පී.ජී.එස්.ජයතිලක මහතා 2021.01.29 දින සිට වසරක කාලයක් උඩපළාත ප්‍රාදේශීය සභාවේ තවදුරටත් සේවය සදහා යොදවා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

තාක්ෂණ නිළධාරි ජයතිලක මහතා තම රාජකාරිය අකුරටම ඉටු කරන බවත් නිළධාරින්ගේ වැරදි නිසා අද සභාව මෙම තත්වයට පත්වී ඇති බවත් එතුමා ගරු මන්ත්‍රී මණ්ඩලය සමඟ ඉතා සුහදශීලිව කටයුතු කරන බවත් සමහර තාක්ෂණ නිළධාරි මහත්වරු දුරකථන ඇමතුමකටවත් ප්‍රතිචාර නොදක්වන බවත් ගරු මන්ත්‍රී මණ්ඩලය අපහසුතාවයට පත් නොකරන ලෙස තාක්ෂණ නිළධාරි මහත්වරුගෙන් ඉල්ලන බවත් ඉන්ද්‍රාණී මහත්මියද එසේම හොඳ අයෙකු නිසා එතුමියද නොබෝ කලකින් පැමිණෙනු ඇතැයි තමා සිතන බවත් තාක්ෂණ නිළධාරින් හතර පස් දෙනෙකු සභාවට පැමිණියොත් අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ වැඩ කටයුතු කරගැනීමට ඉතා පහසු වන බවත් සඳහන් කරන ලදි.

***<u>දිනුක රත්නායක මන්ත්‍රීතුමා</u>***

ජයතිලක තාක්ෂණ නිළධාරි මහතා සමඟ වැඩ කිරිමේදි එතුමා ලබාදෙන සහයෝගය සම්බන්ධයෙන් වචනයක හෝ ස්තූතියක් කල යුතු බවත් එය වගකීම බවත් අනෙක් තාක්ෂණ නිළධාරි මහත්වරු සමඟ තමා වැඩ කර නොමැති බවත් අපි මන්ත්‍රීවරු ලෙස මෙවන් තාක්ෂණ නිළධාරි මහතෙකු සමඟ වැඩ කිරීමට ලැබීම ගැන සතුටු විය යුතු බවත් දූරකථනයෙන් විමසන කාරණා සඳහාද නිසි ලෙස සාධාරණ පිළිතුරු ලබාදෙන බවත් ඒ සමබන්ධයෙන් ස්තූතිවන්ත වන බවත් සදහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>තීරණ අංක 05.1 (7)</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

5 (1.7) ජල කම්කරු අබේකෝන් මහතා විශ්‍රාම යාමෙන් පසු මාගර් කම්කරු එන්.ජී.විජේරත්න මහතා සභාව සතු ජල යෝජනා ක්‍රමයේ රාජකාරි කටයුතු සඳහා අනියුක්ත කර ඇති අතර ඒ සඳහා එම අයට පැය 50ක අතිකාල දීමනාවක් ගෙවීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

***<u>ගරු තංගවේළු කාමරාජන් මන්ත්‍රීතුමා</u>***

සෙනසුරාදා සහ ඉරිදා දිනවල නාලක මහතා වෂර්ාවේ පයින් විත් ජල සැපයුම ලබාදීම සඳහා මහන්සි වී දින 2ක් තුළ අපේ ජනතාවට ජල පහසුකම් ලබාදුන් බවත් ජල අංශයේ වැඩ කරන සියළු දෙනාටම අතිකාල දීමනා ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන බවත් සදහන් කරමින් එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>

අතිකාල දීමනා ලබාදිය යුතු අය සිටී නම් එම සේවාව නිවැරදි ලෙස පවත්වාගෙන යාම සඳහා එම අයටද අතිකාල දීමනා ලබා දි මෙම සේවාවන් වැඩි දියුණු කරගැනීම සඳහා කටයුතු කල යුතු බවත් එතුමා ගෙන ආ අදහස තමාද අනුමත කරන බවත් සදහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

හොරෙන් ගස් කපා ඇති නිසා වතුර බටය කැඩී ඇති බවත් එම වතුර බටයේ වටිනාකම රු.40000.00 පමණ වන බවත් මේ සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ සම්බන්ධතාවයක් ඇතිදැයි තමා නොදන්නා බවත් ඒ නිසා කැඩුණු බටය අළුත්වැඩියා කරන ලෙසට ඉල්ලීමක් කරන ලදි.

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>තීරණ අංක 05.1 (8)</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

5 (1.8) ) 2022 වෂර්යට අදාළ අයවැය කෙටුම්පත සඳහා මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

මෙවර වසර 2ක් තුළ ආදායම අඩු නිසා අඩු ප්‍රතිශතයකට අනුව අයවැය කෙටුම්පත සකස් කල බවත් ඒ අනුව කොරෝනා වසංගත තත්වය මත සාමාන්‍යයෙන් එක් මන්ත්‍රීවරයෙක් සඳහා රු. ලක්ෂ 4 - 4 1/2 පමණ ප්‍රතිපාදන පමණක් ලබාදීමට හැකි වන බවත් දැනට පවතින තත්වය එය බවත් සියළු සංශෝධන ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටින බවත් දන්වමින් වෙනස්කම් ඉදිරිපත් කරන ලෙසත් ඒවා ලිඛිතව ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>

මෙම වසරේ සමස්ථ ආදායම රු.124034586ක් බවත් මේ අනුව අපි ඉදිරි වසරේ ආපස්සට යන බවක් පෙන්නුම් කරන බවත් නමුත් සංශෝධන ඉදිරිපත් කර යම් යම් වෙනස්කම් මත අපගේ අයවැය රු.136400000 ට වැනි ගණනකට යා හැකි බව පෙන්නුම් කරන බවත් මෙම වසරේ අපිට ආදායම් අහිමි වුවත් එන වසර සඳහාද අපි ඒ ඔස්සේම යාමට අවශ්‍ය නොවන බවත් සමහර විට ආදායම් තත්වය අනිවාර්යයෙන්ම යම් යම් ක්‍රියාමාගර් නිසා ඉදිරියට යා හැකිව ඇති බවත් ආදායමට හා වියදමට සාපේක්ෂව යම් යම් සංශෝධන තමා ඉදිරිපත් කරන බවත්,

ආදායම් තත්වය අනුව 2022 වෂර්ය සඳහා වරිපනම් බදු කියන කාරණාවේදි රු.1,336,200.00 යකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.1,636,200.00 ලෙස වධර්නය විය යුතු බවත් ව්‍යාපාර බදු යන කාරණාවේදී 2022 වෂර්ය සඳහා රු.573,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.773,000.00 වගේ අගයකට යා යුතු බවත් ජල ගාස්තු යන කාරණාවේදී 2022 වෂර්ය සඳහා රු.336,600.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.386,600.00 ලෙස ආදායම වධර්නය කරගත යුතු බවත් 1.43 යටෙත් අයකර ගත හැකි ගාස්තු 2022 වෂර්ය සඳහා රු.4,000,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.4,300,000.00 වගේ අගයකට යා යුතු බවත් 2.43 යටෙත් අයකර ගත හැකි ගාස්තු 2022 වෂර්ය සඳහා රු.275,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.375,000.00 වගේ අගයකට යා යුතු බවත් ලියාපදිංචි හා පරීක්ෂණ ගාස්තු 2022 වෂර්ය සඳහා රු.2,000,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.2,350,000.00 වගේ අගයකට යා යුතු බවත් 4.43 (i) යටෙත් අයකර ගත හැකි ගාස්තු 2022 වෂර්ය සඳහා රු.352,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.452,000.00 වගේ අගයකට යා යුතු බවත් 3.52 යටෙත් දඩ 2022 වෂර්ය සඳහා රු.30,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.50,000.00 වගේ අගයකට යා යුතු බවත් බවත් 5.52 යටෙත් දඩ 2022 වෂර්ය සඳහා රු.21,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.26,000.00 වගේ අගයකට යා යුතු බවත් බවත් 6.52 යටෙත් දඩ 2022 වෂර්ය සඳහා රු.18,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.28,000.00 වගේ අගයකට යා යුතු බවත් 1.63 යටෙත් මුද්දර ගාස්තු 2022 වෂර්ය සඳහා රු.27,910,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.37,910,000.00 වගේ අගයකට යා යුතු බවත්

වියදම් තත්වය අනුව 102 යටතේ සාමාන්‍ය ගමන් වියදම් 2022 වෂර්ය සඳහා රු.1,632,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.1,032,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් 103 යටතේ ලිපිද්‍රව්‍ය හා කායර්ාල උපකරණ 2022 වෂර්ය සඳහා රු.2,100,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.1,800,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් ඉන්ධන හා ස්නේහක තෙල් යන කාරණාවේදි 2022 වෂර්ය සඳහා රු.1,450,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.1,250,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් 104 යටතේ වාහන යන්ත්‍ර සූත්‍ර හා කායර්ාල උපකරණ අළුත්වැඩියාව 2022 වෂර්ය සඳහා රු.2,600,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.2,450,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් 105 යටතේ ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා 2022 වෂර්ය සඳහා

රු.550,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.350,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් එහිම දුරකථන බිල් යටතේ 2022 වෂර්ය සඳහා රු.193,500.00 ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.250,000.00 වගේ අගයකට වධර්නය විය යුතු බවත් නිතීඥ හා මිනින්දෝරු ගාස්තු 2022 වෂර්ය සඳහා රු.1,000,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.750,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් 203 යටතේ ලිපිද්‍රව්‍ය හා කායර්ාල උපකරණ 2022 වෂර්ය සඳහා රු.100,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.50,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් 204 යටතේ වාහන යන්ත්‍ර සූත්‍ර හා කායර්ාල උපකරණ අළුත්වැඩියාව 2022 වෂර්ය සඳහා රු.840,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.540,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් 205 යටතේ ප්‍රවාහන යන කාරණාවේදි 2022 වෂර්ය සඳහා රු.250,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.150,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් එහිම වෙනත් සේවා යටතේ 2022 වෂර්ය සඳහා රු.50,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.100,000.00 වගේ අගයකට වධර්නය විය යුතු බවත් 301 යටතේ අතිකාල හා නිවාඩු දින වැටුප් යන කාරණාවේදි 2022 වෂර්ය සඳහා රු.943,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.843,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් 302 යටතේ සාමාන්‍ය ගමන් වියදම් යන කාරණාවේදි 2022 වෂර්ය සඳහා රු.151,200.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.100,200.00 වගේ අගයකට අඩු විය යුතු බවත් 303 යටතේ ඉන්ධන හා ස්නේහක තෙල් යන කාරණාවේදි 2022 වෂර්ය සඳහා රු.849,600.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.749,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් 304 වාහන යන්ත්‍ර සූත්‍ර හා කායර්ාල උපකරණ අළුත්වැඩියාව යටතේ ප්‍රවාහන යන කාරණාවේදි 2022 වෂර්ය සඳහා රු.870,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.500,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් 404 යටතේ ජල යෝජනා ක්‍රම අළුත්වැඩියාව හා නඩත්තුව යන කාරණාවේදි 2022 වෂර්ය සඳහා රු.3,500,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.2,500,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් 604 යටතේ ගොඩනැඟිලි පහසුකම් හා වෙනත් ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව යන කාරණාවේදි 2022 වෂර්ය සඳහා රු.926,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.626,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් 607 යටතේ පුස්තකාල වැඩසටහන් යන කාරණාවේදි 2022 වෂර්ය සඳහා රු.630,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.500,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් එහිම ප්‍රජා සංවධර්න වැඩසටහන් යටතේ 2022 වෂර්ය සඳහා රු.150,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.100,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් එහිම ක්‍රිඩා භූමි සහ ළමා උද්‍යාන නඩත්තුව සහ සංවධර්නය යටතේ 2022 වෂර්ය සඳහා රු.500,000.00 මුදලකට ඇස්තමේන්තු කර ඇති බවත් එය රු.300,000.00 වගේ අගයකට අඩු විය යුතු බවත් සඳහන් කරමින් මෙහි සමස්ථ ප්‍රතිඵලය ලෙස රු.124,034,580.00 ක ආදායමක් කෙටුම්පතෙහි සඳහන් නමුත් අපි මෙම ආදායම වැඩි කර ගැනීමට ඉදිරිපත් කර ඇති සංශෝධන අනුව කටයුතු කලහොත් එවිට ආදායම රු.136,479,580.00 දක්වා වැඩි වන බවත් සමස්ථ වියදම රු.103,284,380.00 ලෙස කෙටුම්පතෙහි සඳහන් නමුත් වියදම් අඩු කිරීම තුළින් රු.98,684,380.00 දක්වා පහළට එන බවත් ඒ අනුව පසුගිය වසරට සාපේක්ෂව ඉදිරියට ගිය ආදායමකට යා හැකි වනු ඇති බවත් ඒ නිසා සියළුම මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගය ලබාදෙනු ඇතැයි බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කල සංශෝධන සහිත අයවැය කෙටුම්පත මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

සියළු සංශෝධන වලට යටත්ව අයවැය කෙටුම්පතට කවුරුන් හෝ විරුද්ධ වනවාදැයි විමසන ලදි.

විරෝධතා ඉදිරිපත් නොවීය

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2022 අයවැය කෙටුම්පත මීට පෙර තිබූ කෙටුම්පත් වලට වඩා වෙනස් බවත් මෙහිදි මහජන නියෝජිතයින් ලෙස ලැබෙන විමදාගත අරමුදල ලක්ෂ හතක සිට ලක්ෂ හතර දක්වා අඩු වී ඇති බවත් කොරෝනා වසංගත තත්වය තුළ අපට තිබෙන ආදායම් තත්වය අඩු වී ඇති බවත් ඒ නිසා සංශෝධන සහිතව ඉදිරිපත් කරනවා නම් අපට ලක්ෂ හතේ ප්‍රතිපාදන වෙත යාමට අවස්ථාව ලබාදෙන ලෙසත් රු.345567.48 ක මුදලක් අපි පොතෙන් කපා හැරීමට යෝජනා කල බවත් ඒ අනුව සභාවට මෙම මුදල අහිමි වන බවත් ඒ නිසා කඩ කුළී, වෙළඳ බලපත්‍ර ගාස්තු පොඩි ප්‍රමාණයක් හෝ වැඩි කල යුතු බවත් උසාවි දඩ,මුද්දර ගාස්තු යනාදිය අපට අහිමි වී ඇති බවත් 2022 වෂර්යේ ජංගම සේවා ක්‍රියාත්මක කර අපට අහිමි වූ ආදායම රැස් කරගත යුතු බවත් බල ප්‍රදේශයේ කොරෝනා වසංගතය අඩු වු පසු වෙළඳ බලපත්‍ර ගාස්තු රු.500.00 සිට රු.550.00 දක්වා වැඩි කල යුතු බවත් සංචාරක කමර්ාන්ත තුළ නියැලෙන මාගර් වලින් අපට ආදායම් රැස් කර ගත යුතු බවත් ත්‍රීරෝද රථ වලින් ලැබෙන ආදායම රැස්කර ගත යුතු බවත් ගරු ශාන්ත මන්ත්‍රීතුමාගේ විග්‍රහයට අනුව වැටුප්, දීමනා, අතිකාල දීමනා, පරිපාලන දීමනා ගෙවිය යුතු බවත් ලිපිද්‍රව්‍ය අපට ගන්න වන බවත් සෞඛ්‍ය පද්ධතියට අපට වියදම් කිරීමට සිදුවන බවත් විදී ලාම්පු දැමීම මෙන් ම කමර්ාන්ත ඉටු කිරීම සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන ලබාදිය හැකි බවත් පක්ෂ භේදයෙන් තොරව කුමන ප්‍රශ්න පැන නැගුනත් සියළු දෙනාටම සම සේ මුදල් ප්‍රතිපාදන ගරු සභාපතිතුමා ලබාදී ඇති බවත් අපි එකමුතු වී එක හා සමානව මේ ගමන යා යුතු බවත් ඒ නිසා සියළු දෙනා ගැටුම් ඇති නොකර සහයෝගයෙන් කටයුතු කර 2022 සංශෝධන සහිත අයවැය කෙටුම්පතට අනුව ඉදිරි අයවැය ලේඛනය සම්මත කර නිවැරදි ගමනක් යමු යැයි සඳහන් කරන ලදි.

<u>ගරු හේමකුමාර නයනානන්ද මන්ත්‍රීතුමා</u>

54 වගන්තියේ විදී පහන් හා ප්‍රාග්ධන වත්කම් ගැන සඳහන් කිරීමේදී 2020 වෂර්යේ රු.95,588.00කුත් 2021 වෂර්යේ රු.150,000.00 මුදලකුත් යොමු කර ඇති බවත් නමුත් 2022 වෂර්යේ රු.84,000.00 යොදවා ඇති බවත් ඒ නිසා 2022 වෂර්යේ විදී ලාම්පු සවි කිරීම සඳහා තව මුදලක් වැඩි කරන ලෙසට යෝජනා කරන ලදි.තවද පන්සල්,පල්ලි,කෝවිල් සහ ළමා සුරැකුම් මධ්‍යස්ථාන වලට මුදල් යොදවා නැති බැවින් රු.50,000.00 මුදලක් මේ සඳහා යොදවන ලෙසට මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

විදී ලාම්පු වලට අවශ්‍ය කරන සම්පූණර් බඩු භාණ්ඩ ගෙනැවිත් ඇති නිසා මුදල් ප්‍රමාණය අඩු කල බවත් තවද කොරෝනා වසංගත තත්වය නිසා විදී ලාම්පු සවි කිරීමට නොහැකි වූ බවත් සඳහන් කරන ලදි.

ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා

2022 අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් කථා කිරිමේදි රටේ පවතින තත්වය අනුව කුමන තත්වයකට මුහුණ දීමට සිදුවේදැයි කිව නොහැකි බවත් අත්‍යාවශ්‍ය සේවා කටයුතු අනුව ඉදිරි සංවර්ධන සැළසුම් තීරණය වන බවත් ඒ නිසා මෙතරම් බැරෑරුම් තත්වයක සියළු ප්‍රශ්න දරාගෙන මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස රු.ලක්ෂ හතරක මුදලක් ලබාදීම සම්බන්ධයෙන් සතුටු වන බවත් හැකිතාක් වියදම් තුලිත කරගෙන සංවර්ධන කටයුතු සඳහා මුදල් වැඩි කර ගැනීමට කටයුතු කල යුතු බවත් ප්‍රාදේශීය සභාවෙන් කාපට් දැමූ මාගර් වල දෙපස ආරක්ෂා කිරීම,පවිත්‍ර කිරිම කල යුතු බවත් ජල සම්පාදනය සමඟ එක්ව කටයුතු කල ව්‍යාපෘති වල සාර්ථකභාවය අඩු නිසා කැඩි ඇති මාගර් සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කල යුතු බවත් සඳහන් කරමින් සංශෝධන සහිත අයවැය කෙටුම්පතට සහයෝගය ලබාදෙන බව සඳහන් කරන ලදි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

2021 වසර්යේ කමර්ාන්ත ඉතා ඉක්මනින් සිදු කර අවසන් කරන ලෙසත් ගිය වසරේ මෙන් ණයගිම් කිරීම කල නොහැකි බවත් ඒ නිසා අපේ ගරු මන්ත්‍රී මණ්ඩලයට ලබාදෙන ප්‍රතිපාදන මුදල මොනයම් ආකාරයකින් කඩින් කඩ හෝ ලැබෙන ආදායම අනුව වැඩි කර දෙන ලෙස ඉල්ලීමක් කරන බවත් සත්භාවයෙන් ජයග්‍රහණය කල පක්ෂය සඳහා රජයෙන් මුදල් ලබාදෙන බව ලිපි මඟින් ඉල්ලා ඇති බවත් ඒ අනුව රු. ලක්ෂ 40 බැගින් කොට්ඨාශ 26 තුළ විශාල සංවර්ධනයක් සිදුකල හැකි බවත් සඳහන් කරමින් සංශෝධන සහිත අයවැය කෙටුම්පත පිළිගන්නා බව සඳහන් කරන ලදි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

සත්‍ය ආදායම ලෙස අපට 2020 ලැබී ඇත්තේ රු.කෝටි 04ක් බවත් 2021 වෂර්යේ කෝටි 01ක ආදායමක් ලැබී ඇති බවත් අනිත් මුදල් ප්‍රතිපූණර් බවත් 2020 වෂර්යේ දස කෝටියක ආදායමක් බලාපොරොත්තු වූවත් එයින් කෝටි 05 ක මුදලක් වැටුප් ප්‍රතිපූණර් බවත් සභාවේ ආදායම ලෙස දඩ මුදල්,කඩ කුළී,බලපත්‍ර ගාස්තු,වරිපනම් බදු ආදි ආදායම රු.4,700,000.00 මුදලක් ලෙස සඳහන් නමුත් එයින් කෝටි 01ක මුදලක් මන්ත්‍රී දීමනා සඳහා වැය වන බවත් සභා ආදායම රු. කෝටි 01ක් බවත් ඉන්ධන දීමනා රු.ලක්ෂ 15කුත් දුරකථන දීමනා රු.ලක්ෂ 8කුත් වැය වන බවත් වාෂරීකව රු.7900000.00 ක මුදලක් දීමනා සඳහා වැය වන බවත් 06 වන මාසය වන විට කෝටි 01 ක ආදායමක් පමණක් ලැබී ඇති බවත් ඒ තුළ විශාල සංවර්ධනයක් ඉටු කල බවත් 2019,2020,2021 වෂර්වල ආදායම දෙස බලා 2022 අයවැය කෙටුම්පත සකස්කර ඇති බවත් රටේ පවත්නා තත්වය අනුව ප්‍රාදේශීය සභා ඉතිහාසයේ අඩුම ලංසුවකට නිමර්ාණය වූ අයවැය මෙය බවත් එක් කොට්ඨාශයකට ලක්ෂ 40 බැගින් කෝටි 20ක මුදල් ප්‍රතිපාදන ලබන වසරේ ලැබෙන බවත් මෙම අයවැය අපහසුතාවයෙන් නිමර්ාණය කලත් වත්තේහේන ජල ව්‍යාපෘතියේ ඒකක 800ක් පමණ ලබාදී ඇති බැවින් ජල බිල්පත් අයකර ගැනීමට නොහැකි නිසා හිඟ මුදල් ශේෂය වැඩි වන බවත් ලබන වසරේ දැවැන්ත සංවර්ධනයක් සිදුවන බවත් සඳහන් කරන ලදි.

ගරු නවරත්න රත්නායක මන්ත්‍රීතුමා

මීට පෙර සිට අපි කථා කල පොදු සුසාන භූමි නිරවුල් කිරීම, සභාවේ වැඩ ඒකකයක් ආරම්භ කිරීම, සභාවට බැකෝ යන්ත්‍රයක් මිලදී ගැනීම සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් කෙටුම්පතට ඇතුළත් කර නොමැති බවත් තවද ගරු අගලවත්ත මන්ත්‍රීතුමා සඳහන් කල පරිදි සියළු දෙනාගේ මතය අනුව එක් විශේෂ යෝජනාවක් යොමු කරන බව පැවසුවත් කෙටුම්පතෙහි එවැනි යෝජනා

කිසිවක් නොමැති බවත් මුදල් ප්‍රමාණය වැඩිකර ගත යුතු නම් දේශපාලනයේ නියැලීම සමාජ සේවාවක් ලෙස සලකා කටයුතු කරන ලෙසට ඉල්ලීමක් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

බැකෝ යන්ත්‍රය ලබාගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇති බවත් බැකෝ යන්ත්‍රය ගැනීමට කොම්ප්ට්‍රොලර් ජෙනරාල්තුමා අත්සන් කල යුතු බවත් ඒ අනුව ගරු බැසිල් ඇමතිතුමාට කථා කර ගරු ආණ්ඩුකාරතුමා අත්සන් කර යවා ඇති බවත් වැඩ ඒකකය සෑදීමට අවශ්‍ය ඉඩමේ ගැටළු තවම විසඳා ගැනීමට නොහැකි වූ බවත් තමාද වැඩි මුදලක් ගරු මන්ත්‍රීවරුන්ට ලබාදීමට කැමති බවත් ඔබතුමන්ලා සඳහන් කල සියළු දේවල් අවශ්‍ය තැන් වලට යොමු කර ඇති බවත් මුදල් අයකිරීමේ ගැටළුව කොරෝනා තත්වය නිසා අතපසු වූ බවත් එනිසා ජංගම සේවා පවත්වා මුදල් එකතු කරන බව සඳහන් කරන ලදි.

ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගයෙන් අපි සියළු දේ ඉටු කල බවත් කොරෝනා වසංගත තත්වය තුළ ඒ සඳහා අපි සභාවක් ලෙස රු.ලක්ෂ 18ක් පමණ වැය කර ඇති බවත් මුදල් ප්‍රමාණය වැඩි කර ගැනීමට ඔබතුමන්ලාගේ සහයෝගය බලාපොරොත්තු වූ බවත් එහිදි සභාවේ අනුමැතිය තුළ තමා මුදල් වියදම් කල බවත් නමුත් මේ වන විට එන්නත්කරණය සඳහා රු.ලක්ෂ 13ක් පමණ වැය වී ඇති බවත් ඒ සම්බන්ධයෙන් සභාව ලබා දුන් සහයෝගය අගය කරන බවත් සඳහන් කරන ලදි.

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

තීරණ අංක 05.1 (9)

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

05.1 (9) 2022 වර්ෂය සඳහා කඩ කාමර සහ දේපල ටෙන්ඩර් කිරීමට හා මාසිකව අයකල යුතු මුදල සංශෝධනය විය යුතු ආකාරය සඳහා මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

තීරණ අංක 05.1 (10)

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

05.1 (10) 2019 සහ 2020 වර්ෂවල අතරදී මුදල් ලබා ගැනීමට ඉල්ලීම් නොකල කමර්ාන්තවල මුදල් සභාවේ පොදු අරමුදලට බැර කිරීම සුදුසු බවට මම යෝජනා කරමි .

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

2020 වෂර්වල අතරැදි මුදල් ලබා ගැනීමට ඉල්ලීම් නොකල කමර්ාන්තවල මුදල් ලබා ගැනීම සඳහා අදාළ සමිති දැනුවත් කර කටයුතු කිරීම සඳහා සති 2ක සහන කාලයක් ලබා දීම සුදුසු බවත් සඳහන් කරමින් මෙම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

ගරු මන්ත්‍රීතුමන්ලා මේ සම්බන්ධයෙන් සමිති දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

තීරණ අංක 05.1 (11)

05.1(11) උඩපළාත ප්‍රාදේශීය සභාවේ ඵලදායිතා විෂය සම්බන්ධීකරණ කටයුතු ඉටුකරන සංවධර්න නිළධාරි කේ.ජී.එස්. ලක්මාලි මහත්මියට (online) මාගර්ගත ක්‍රමය ඔස්සේ උසස් ඵලදායිතා පාඨමාලාව හැදෑරීම සඳහා රු.5000.00 මුදලක් ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

මාගර්ගත ක්‍රමය ඔස්සේ උසස් ඵලදායිතා පාඨමාලාව හැදෑරීම සඳහා රු.5000.00 මුදලක් ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

තීරණ අංක 05.1 (12)

05.1 (12) උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනෙන් අවසන් වන වෂර්ය සඳහා දැල්පිටිය ප්‍රධාන කායර්ාලය ,පුස්සැල්ලාව උප කායර්ාලය, (දැල්පිටිය,පුස්සැල්ලාව,දොළුව, වාරියගල,.හුණුගල,ග්‍රෝව්හිල්) යන පුස්තකාල ආදී සියළු අංශවල භාණ්ඩ සමීක්ෂණය සඳහා පත් කරන කමිටු 06 වෙනුවෙන් එක් කමිටුවක් සඳහා එක් මහජන නියෝජිතයෙකු බැගින් පත්කර ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි .

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

භාණ්ඩ සමීක්ෂණය කටයුතු ඉටු කිරීමේදී දැල්පිටිය සඳහා ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා, පුස්සැල්ලාව සඳහා ගරු ධනුෂ්ක ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා, දොළුව සඳහා **ගරු උප සභාපති** අසේල අමරසේන **මහතා**,වාරියගල සඳහා ගරු ගයානී ඇතුගල්පේ මන්ත්‍රීතුමිය,හුණුගල සඳහා ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා, ග්‍රෝව්හිල් සඳහා ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා යන ගරු මන්ත්‍රීවරු පත්කර ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි .

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

තීරණ අංක 05.1 (13)

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

05.1 (13) 252-6339 කැබ් රථය අළුත්වැඩියාව සඳහා අදාළ බිල්පතේ සඳහන් මුදල වන රු.18850.00ක මුදල මීවතුර මෝටසර් ආයතනයට ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

තීරණ අංක 05.1 (14)

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

05.1 (14)දොළුව කඩවීදියේ පොදු වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීමේදී වෙළඳපොළ මිල වැඩිවීමක් ඇති බැවින් සංශෝධිත ඇස්තමේන්තුවට අනුව රු.310000.00 වැය වන බැවින් ඒ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු **ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා**

එම යෝජනාව මම ස්ථිර කරමි.

පොදුවේ ගිවිසුම් අත්සන් කර ඇති කමර්ාන්ත වලද දැනට ක්‍රියාත්මක කල යුතු සියල්ලෙහිම ඇස්තමේන්තු සංශෝධනය කර දෙන ලෙසට ඉල්ලීමක් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

**5 (2) ගරු A.H.A රත්නායක මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.1) සභාව සතුව පවතින මාගර් සහ ළිං අළුත්වැඩියා කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.2)සභාව සතුව පවතින වාහන අළුත්වැඩියා කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.3)මහ සභාවේ නම පවතින යෝජනාවක් සම්මත කර ඉටු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ගරු A.H.A රත්නායක මන්ත්‍රීතුමාගේ යෝජනා මෙම සභාවෙන් ඉවත් කර ලබන සභාවට යොමු කරන බව සඳහන් කරන ලදි.

**කමර්ාන්ත යෝජනා**

**ගරු සභාපති ඩී.ජී.ගුණසේන මැතිතුමාගේ යෝජනා**

5 (2.4) නාරංවිට ළමා උයන සංවධර්නය කිරීම රු.300000.00

5 (2.5) පුස්සැල්ලාව මන්තින්ධාරාම විහාරස්ථානය පිටුපස පොදු කාණුව ඉදිකිරීම රු.200000.00

5 (2.6) පුස්සැල්ලාව නව වැසිකිළි පද්ධතිය සඳහා වැසි ආවරණයක් පඩිපෙළට අත්වැටක් හා මුර කුටියක් ඉදිකිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු සෙල්වරාජ් කාතරීකා මන්ත්‍රීතුමියගේ යෝජනා**

5 (2.7)පන්සල ප්‍රධාන මාගර්යේ සිට පුෂ්පා නිවස සිට ඇතුළු මාගර්ය සංවධර්නය කිරීම රු.500000.00,

5 (2.8)ශිවගුරු නිවස සිට ඇතුළු මාගර්ය සංවධර්නය කිරීම රු.200000.00,

**ගරු තංගවේළු කාමරාජන් මන්ත්‍රීතුමාගේ යෝජනා**

5(2.9) නිව්පිකොක්වත්තේ එන්.පි.කොටසට පි.වි.සි. නල ලබාදිම රු.100000.00 කමර්ාන්තය වෙනුවට **සංශෝධන කමර්ාන්තයක් ලෙස** වප්ලි වතුයාය ජනපදයේ ජල යෝජනා ක්‍රමය අළුත්වැඩියා කිරීම රු.100000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු චමිලා ෆොන්සේකා මන්ත්‍රීතුමියගේ යෝජනා**

5(2.10)පල්ලේගම වසමේ කමලා මහත්මියගේ නිවස අසළ මාගර්ය සංවධර්නය කිරීම රු.100000.00 කමර්ාන්තය වෙනුවට **සංශෝධන කමර්ාන්තයක් ලෙස** සැන්කුවාර් පහළ කොටසේ පානීය ජල උල්පත දෙවන අධියර සංවධර්නය කිරීම රු.100000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු අගලවත්ත මන්ත්‍රීතුමාගේ යෝජනා**

5(2.11) වත්තේගේන පුපුරුස්ස පාරේ සිට දේවිකා යන අයගේ නිවස දෙසට යන මාගර්ය සංවධර්නය කිරීම රු.100000.00 කමර්ාන්තය වෙනුවට **සංශෝධන කමර්ාන්තයක් ලෙස** ඉහළගම කැටවල මාගර්යේ සිට වත්තේකඩේ මාගර්යේ පැති බැම්ම සංවධර්නය කිරීම රු.100000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ඩබ්.ඩී.ජී.ගුණතිලක මන්ත්‍රීතුමාගේ යෝජනා**

5(2.12)අඹවත්ත මාගර්යේ බෝක්කුව සංවධර්නය කිරීම රු.100000.00 කමර්ාන්තය වෙනුවට **සංශෝධන කමර්ාන්තයක් ලෙස** අඹවත්ත මාගර්ය සංවධර්නය කිරීම රු.100000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

ගරු සෙල්වරාජ් කාතරීකා මන්ත්‍රීතුමියගේ රු.700000.00 කමර්ාන්ත යෝජනා සහ ඉදිරිපත් කර ඇති සියළුම සංශෝධිත කමර්ාන්ත යෝජනා පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනා මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

**(6) කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

1.2021/10/ 14 දින ටෙන්ඩර් කමිටු වාර්තාව

2. 2021/09/ 23 දින සහ 2021/10/11 දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම

3.2021/09/ 23 දින හා 2021/10/11 කමර්ාන්ත කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම

4.2021.08.03 දින නිවාස සහ ප්‍රජා සංවධර්න කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම

**ගරු කීතර්ී රත්නායක මන්ත්‍රීතුමා**

ඉදිරිපත් කර ඇති සියළුම කමිටු වාර්තා පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

**(7) ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම** - 2021 සැප්තැම්බර් මස ආදායම් වියදම් වාර්තාව හා ආදායම් ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීම

**උඩපළාත ප්‍රාදේශීය සභාව**
**ආදායම් වියදම් වාර්තාව - 2021 සැප්තැම්බර්**

| | ආදායම් | | | | | වියදම් | |
|---|---|---|---|---|---|---|---|
| **10** | වරිපනම් හා බදු | | | | 1 | වැටුප් හා දීමනා | 4,498,144.94 |
| i | වරිපනම් හා බදු | 1,941.80 | | | | | |
| ii | අක්කර බදු | - | | | 2 | ගමන් වියදම් | 89,624.00 |
| iii | ජල ගාස්තු | 500.00 | | | | | |
| iV | ව්‍යාපාර බදු | | 5,000.00 | 7,441.80 | 3 | සැපයුම් හා උපකරණ | 415,991.50 |
| **20** | කුළී | | | | | | |
| i | ගෙවල් කුළී | 2,375.00 | | | 4 | ප්‍රාග්ධන වත්කම් | |
| ii | වෙළඳ අයිතිය බදු දීම | | - | | | අළුත්වැඩියාව හා නඩත්තුව | 1,393,791.56 |
| iii | පොදු වැසිකිළිය | | - | | | | |
| iv | බදු මුදල් | - | | | | | |
| v | කුලියට දීම | - | | 2,375.00 | | | |
| **30** | බලපත්‍ර ගාස්තු | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| i | වෙළඳ බලපත්‍ර වෙළඳ | 50,200.00 | | 5 | ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යක සේවා | 121,980.77 |
| ii | බලපත්‍ර ත්‍රිරෝද | 1,200.00 | 51,400.00 | | | |
| **40** | සේවා සඳහා ගාස්තු | | | | | |
| i | ලී.ප. සහතික හා පරීක්ෂණ ගාස්තු | 35,593.00 | | 6 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 8,410.27 |
| ii | අය කර ගත හැකි ගාස්තු | 105,175.00 | 140,768.00 | | | |
| **50** | වරෙන්තු ගාස්තු හා දඩ | | | 7 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 20,000.00 |
| i | දඩ මුදල් | 262.50 | 378.76 | | | |
| 2 | වරෙන්තු ගාස්තු | 116.26 | | | | |
| **60** | වෙනත් ආදායම් | | | | | |
| i | පොලී | | | 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂික | - |
| ii | විකුණුම් | 116,646.00 | | | | |
| iii | මුද්දර ගාස්තු | - | | | | |
| iV | සේවක ණය පොලී | 52,781.68 | 169,427.68 | | | |
| **70** | වෙනත් ආධාර | | | 9 | ප්‍රාග්ධන වැය | 2,474,350.86 |
| i | පරිපාලනමය ප්‍රතිපූර්ණ | 4,099,169.94 | | | | |
| ii | සාමූහික ආධාර | - | 4,099,169.94 | | | |
| **80** | මූලධන ලැබීම් | | | | අත්තිකාරම් ගෙවීම | - |
| i | මූලධන ආධාර | | - | | සේවක ණය | 133,900.00 |
| | සේවක ණය | | 330,936.00 | | ණයහිමි ගෙවීම් | 822,752.50 |
| | තැන්පත් | | 420,388.35 | | තැන්පත් | 728,815.48 |
| | කර්මාන්ත ණයගැති ලැබීම් | | 336,906.17 | | ස්ථාවර තැන්පත් | - |
| | අත්තිකාරම් පියවීම | | - | | අතිරික්තය | |
| | ඌනතාවය | | 5,148,570.18 | | | |
| | | | **10,707,761.88** | | | **10,707,761.88** |

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

2021 සැප්තැම්බර් මස ආදායම් වියදම් වාර්තාව හා ආදායම් ප්‍රගති වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

සමහර ගරු මන්ත්‍රීවරු මහ සභාවට නොපැමිණෙන බවත් ඒ බව ලිඛිතව මහ සභාවට දන්වන ලෙසත් ඉල්ලා සිටිමින් අද දින සභාවට නොපැමිණි ගරු ***මන්ත්‍රීතුම***න්ලාගේ සහ ***මන්ත්‍රීතු***මියන්ලාගේ නිවාඩු අනුමැතිය සදහා සභාවට යොමු කරන ලදි.

*ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා*

අද දින මාසික මහ සභාවට නොපැමිණි සියළුම මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

**(8) වෙනත් - නැත**

**(9) ඉදිරි මහ සභා දිනය තීරණය කිරීම-**

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

පවත්නා වාතාවරණය අනුව ඉදිරි මහ සභා දිනය තීරණය කර දන්වන බව සදහන් කරන ලදි.

## (10) මහ සභාව අවසන් කිරීම

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තමා අද දිනයේ වඩාත් සතුටු වන බවත් යම් යම් ගැටළු මත කටයුතු කලත් සියළු ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවයෙන් 2022 අයවැය කෙටුම්පත සම්මත කරගැනීමට හැකි වූ බවත් ඒ සම්බන්ධයෙන් ලේකම්තුමිය ඇතුළු කාර්‍ය මණ්ඩලයේ සියළු දෙනාටත් ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් විශේෂ ස්තූතියක් පුද කරන බවත් එසේම  අද දින මහ සභාවට සහභාගී වූ ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කාර්‍ය මණ්ඩලයටත් ස්තූතිවන්ත වෙමින් සියළු දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් ප.ව.1.30ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි.

ලේකම් | සභාපති

උඩපළාත ප්‍රාදේශීය සභාව | උඩපළාත ප්‍රාදේශීය සභාව